## සංක්ෂේපය


මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සඳහා තරුණ සහභාගීත්වය අඩුවීමට බලපා ඇති හේතු සාධක විමසා බැලීම ය. මෙහි විශේෂිත අරමුණ වූයේ, රැකියාවක් වශයෙන් කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් තරුණ පිරිසගේ අදහස් විමසා බැලීම, තරුණයින් කෘෂිකර්මාන්තයට ඇදගැනීමටත්, ඉන් බැහැර කිරීමටත් බලපා ඇති සාධක හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීමත්, සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය වැඩිකිරීම සඳහා තරුණයින් සහ අනෙකුත් හවුල්කාර පාර්ශවයන් වෙතින් ඉදිරිපත් වන අදහස් සාකච්ඡා කිරීමත් ය. ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි, මූලික තොරතුරු සපයන්නන් හා ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මාර්ගයෙන් සිදු විය. නුවරඑළිය, මාතලේ, හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, අම්පාර, මඩකලපුව සහ මොණරාගල දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කෙරිණි. විශ්වවිද්‍යාල උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් ද ඇතුළත් වූ සමස්ත නියැදිය 533කි. ප්‍රතිචාරීන් සියලුදෙනා වයස අවුරුදු 15-29 කාණ්ඩයට අයත් වූහ.

තරුණ සහභාගීත්වයේ ස්වභාවය සහ ප්‍රමාණය, වගා ක්‍රමය සහ බෝගය අනුව වෙනස් වේ. සමස්ත නියැදියෙන් 70%ක් පූර්ණකාලීන, අර්ධකාලීන හෝ පවුලේ ශ්‍රමිකයින් වශයෙන් කෘෂිකර්මාන්තයට අදාළ විවිධ කාර්යන් හි නියුක්ත වූ අතර 7.3%ක් කෘෂිකර්මාන්තයට සම්බන්ධ කර්මාන්ත හෝ ව්‍යාපාරවල නිරත වූහ. සමස්ත නියැදියෙන් 58.2%ක් පූර්ණකාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති බව ප්‍රකාශ කළ අතර 39.6%ක් පූර්ණකාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට අකමැති බවත්, 2.3%ක් ඒ සම්බන්ධයෙන් තමන්ට පැහැදිළි අදහසක් නොමැති බවත් පැවසූ හ.

අනාගතයේ දී ද, පූර්ණකාලීන ව කෘෂිකර්මාන්තයෙන් නියැලීමට කැමැත්තෙන් පසු වූ ප්‍රතිචාරීන්ගෙන් බහුතරය කෘෂිකර්මාන්තයෙහි දිගුකාලීන අත්දැකීම් සහිත, ඉඩම් හිමි සහ ශ්‍රමය සපයාගත හැකි අය වූහ. අනෙක් අතට ඔවුන් බොහෝ දෙනෙක් 'යහපත් රැකියාවක්' සඳහා අවශ්‍ය පුහුණුවීම් හෝ ප්‍රමාණවත් හැකියාවන් සහිත අය නොවූ හ.

සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙහි තරුණ සහභාගීත්වය, වයස, විවාහක/අවිවාහක බව, ගොඩ ඉඩම්, කුඹුරු ඉඩම්, ව්‍යාප්ති සේවා, අලෙවිකරණ පහසුකම් පැවතීම, ඒවාට ප්‍රවේශවීමේ හැකියාව සහ උසස් අධ්‍යාපනය යන සාධක සමඟ සැලකිය යුතු අන්දමින් සම්බන්ධ වේ. එමෙන් ම, ස්ත්‍රී/පුරුෂභාවය, කුඹුරු ඉඩම්වල ප්‍රමාණය, පවුලේ ආදායම, සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් නොවීම, කෘෂිකර්මාන්තය සඳහා වන අඩු පිළිගැනීම හෝ පිළිගැනීමක් නොවීම ආදී සාධක ද කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය සම්බන්ධයෙන් බලපානු ලබන සාධක වේ.

තරුණයින් කෘෂිකර්මාන්තයට ආකර්ෂණය කරගැනීම සඳහා යෝජනා රාශියක් ඉදිරිපත් කෙරේ. පවතින තරුණ ගොවි සමාජ ශක්තිමත් කිරීම, අවශ්‍ය සහාය ලබාදෙමින් වඩා ඵලදායී ආකාරයෙන් නව තරුණ

ගොවි සමාජ පිහිටුවීම, තරුණයින් සඳහා සමුපකාරික ක්‍රමයේ ව්‍යාපාර සහ කර්මාන්ත පිහිටුවීම, කෘෂිකර්ම උපදේශකවරුන් සංඛ්‍යාව ඉහළ දැමීම සහ ඔවුන් වෙතින් සැපයෙන සේවාවේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම, කෘෂිකර්මාන්තයට අදාළ අධි තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම සහ ඒවා යොදාගෙන කෘෂිකර්මාන්තයේ නියැලීමට තරුණයින්ට සහායවීම, කෘෂිකර්මාන්තයට සම්බන්ධ රාජ්‍ය අංශයේ රැකියා (විශේෂයෙන් ම, අර්ධ ස්වායත්ත ආයතන සහ ව්‍යාප්ති සේවාව සඳහා) බඳවා ගැනීමේ දී කෘෂිකාර්මික පවුල්වල අයට විශේෂිත පංගු ක්‍රමයක් වෙන් කිරීම, තරුණ ගොවීන්ට අවම පොළී ප්‍රතිශත යටතේ ණය ලබාදීම සහ පුහුණුවීම් සැපයීම ඒ අතුරින් ප්‍රමුඛ වේ.